යුද සමයේදී වළ දැමූ බව කියන රත්රන් සොයා ගිය පිරිසක් අත්අඩංගුවට ගත් පුවතක් ලංකාදීප ඔන්ලයින් (පෙබරවාරි 06, 2022) , තිනකරන් (පෙබරවාරි 07, 2022) සහ වීරකේසරී (පෙබරවාරි 07, 2022) පුවත්පත්වල පළ වී තිබුණි.

ලංකාදීප ඔන්ලයින්හි දැක්වුනේ අත්අඩංගුවට ගත් පුද්ගලයින් ජීවත්වන ප්‍රදේශ සහ වයස් කාණ්ඩය පමණි.

තිනකරන් සහ වීරකේසරී පුවත් වාර්තාවන් හි දැක්වුණේ, එම පිරිසෙහි දමිළ ජාතිකයින් 05 දෙනෙකු සහ එක් "ඉස්ලාම් භක්තිකයෙකු" (ඉස්ලාමියාර්) සිටි බවයි.

පුවතකට සෘජුවම අදාළ නොවන්නේ නම් පුද්ගලයින්ගේ වාර්ගිකත්වය පුවත තුළ සඳහන් නොකරන මෙන් ශ්‍රී ලංකා කර්තෘ සංසදයෙන් හඳුන්වා දුන් ආචාර ධර්ම මාලාවේ මෙන්ම ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්මයන් තුළද දැක්වේ.

1) මෙම සිදුවීමට අදාළව අත්අංගුවට ගත් පුද්ගලයින්ගේ වාර්ගිකත්වයන් තිනකරන් හා වීරකේසරී පුවත් වාර්තාවන්වල ඉස්මතු කර ඇත්තේ ඇයි? එම වාර්ගිකත්වයන් මෙම පුවතට අදාල වන්නේ කෙසේද ?

2) වාර්ගිකත්වයන් සඳහන් නොකර වූවද, පුවතෙහි අගයට හානියන් නොවන ලෙස වාර්තා කිරීමට හැකි නොවේද?

3) එසේ නම්, ඉහත පුවත් වාර්තා අතුරින් ඔබ තෝරාගන්නේ කුමන වාර්තාකරණයද?